# විද්‍යාවේදී (ආහාර තත්ව කළමනාකරණය) බාහිර උපාධි පාඨමාලාව
# 01 වන කණ්ඩායම (2020-2022)
# පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය
# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඒකාබද්ධව පවත්වනු ලබන විද්‍යාවේදී ආහාර තත්ව කළමනාකරණය පිළිබඳ බාහිර උපාධි පාඨමාලාවේ පළමු කණ්ඩායම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**ඇතුළත්වීමේ සුදුසුකම්**

පහත සඳහන් සුදුසුකම් වලින් අවම වශයෙන් එකක් සහිත ආහාර කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවානියුක්තියන් හෝ ආහාර සම්බන්ද ව්‍යාපාර ව්‍යවසායකයන් හෝ ආහාර තත්ව කලමනාකරණයට උනන්දුවක් දක්වන්නන් හට අයදුම් කළ හැකිය.

01) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විද්‍යා, තාක්ෂණ, යන විෂය ධාරා වලින් උසස් පෙළ හදාරා උසස් පෙළ විභාගයේ දී අවම වශයෙන් එක්වර විෂයයන් තුනක් (03) ක් සමත් වීම.

සහ

ආහාර කර්මාන්ත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක (02) සේවා පළපුරුද්දක් සහිත වීම.

හෝ

උසස් ජාතික ආහාර තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDFT) හදාරා තිබීම.

හෝ

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් පවත්වනු ලබන තත්ව කළමනාකරණ ඩිප්ලෝමාව / ආහාර තත්ව කළමනාකරණ ඩිප්ලෝමාව හදාරා තිබීම.

02) ඉහත 01 අදාල සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යයන මණ්ඩලය මගින් නිර්දේශ කරන සහ සෙනෙට් සභාවේ අනුමැතිය ලබන සුදුසුකම්.

**බඳවාගැනීමේ පටිපාටිය** : ඇතුළුවීමේ සුදුසුකම් සපුරාලන ඉල්ලුම්කරුවන් ආහාර විද්‍යාවෙ මූලික සිද්ධාන්ත හා ඉංග්‍රීසී භාෂාව ඇතුළත් ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයට ඉදිරිපත්විය යුතුයි. විෂයන් දෙක සඳහාම අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගන්නා අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඉහත ඇගයීම් වලින් සාර්ථක අපේක්ෂකයින් පාඨමාලාව සඳහා බඳවාගනු ලැබේ.

**පාඨමාලා අධ්‍යයන කාලය** : අධ්‍යයන වර්ෂ 03 කි (2020 - 2022).

**පාඨමාලා මාධ්‍යය** : පාඨමාලාවේ අධ්‍යයන කටයුතු ඉංග්‍රීසී මාධ්‍යයෙන් දුරස්ථ අධ්‍යාපන ක්‍රමය යටතේ පවත්වනු ලැබේ. මුද්‍රිත පාඨමාලා පෙළ පොත් සපයනු ලැබේ.

**පාඨමාලාවේ ගාස්තු** : රු. 450,000/- කි. (ලියාපදිංචි වීමේදී රු. 50,000/- හා ඉතිරිය වාරික 5 කින් ගෙවිය යුතුය).

**පාඨමාලා ආරම්භය** : 2019 පෙබරවාරි.

අයදුම්පත්‍ර ලබාගැනීම සඳහා පැමිණ හෝ ලිපිනය ලියන ලද රු. 45/- ක් වටිනා මුද්දර ඇලවූ (9''×4'') ලිපි කවරයක් **සහකාර ලේඛකාධිකාරි, පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය , ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල** :NWP) යන ලිපිනයට එවීමෙන් හෝ වයඹ විශ්වවිද්‍යාලයෙහි නිළ වෙබ් අඩවිය වන www.wyb.ac.lk (Announcements) වෙත පිවිසීමෙන් ලබා ගත හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීමට අදාළ සහතිකවල පිටපත් සහ රැකියාව තහවුරු කිරීමට අදාළ අනෙකුත් ලිපි ලේඛනවල (පත්වීමේ ලිපිය සහ EPF/ETF අංක සහිත වැටුප් පත්‍රිකාව) පිටපත් සහිතව මහජන බැංකුවේ මාකඳුර ශාඛාවේ 137 - 1001 - 3 - 0041538 දරණ ගිණුම් අංකයට බැර කරන ලද රිසිට්පතසමඟ ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ පාඨමාලාවේ නම සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් 2019 දෙසැම්බර් 16 වන දිනට ප්‍රථමයෙන් **සහකාර ලේඛකාධිකාරි, පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය,ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල** (NWP)යන ලිපිනයට එවිය යුතුය.අසම්පූර්ණ සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරි, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය.